## සුරකිමු පරිසරය

- ඔබ අප ජීවත් වන වටපිටාව පරිසරයයි.
- පරිසරයට අප ආදරය කරන තරමටම පරිසරය ද අපට ආදරය කරයි.
- එබැවින් පරිසරය රැක ගනිමින් අපි පරිසරයෙන් වැඩ ගනිමු. පරිසරයට හිතවත් වෙමු..

## කාබනික පළිබෝධනාශක සැකසීමේදී හා භාවිතයේදී මේ ගැනත් සැළකිලිමත් වෙමු

සැකසීමේදී,

- වගාවට යෙදීමට ආසන්නයේදීම මිශ්‍රණය සකසන්න.
- සෑම විටම නැවුම්, පිරිසිදු ශාක කොටස් තෝරා ගන්න.
- හැකිතාක් දුරට ඒ සඳහා වෙන්කර ගත් උපකරණ භාවිතා කරන්න.
- භාවිතා කරන අමුද්‍රව්‍ය නිර්දේශිත ප්‍රමාණයට යොදන්න.
- පිරිසිදු ජලය භාවිතා කරන්න.

භාවිතයේදී,

- සාදාගත් මිශ්‍රණය යෙදීමට පෙර හොඳින් මේරූ අස්වැන්න නෙලා ඉවත් කර ගන්න.
- සවස් කාලයේ බෝග වලට යොදන්න
- වර්ෂා අවස්ථාවේ දී හෝ වර්ෂාවක් ආරම්භ වීමට ආසන්නව යෙදීමෙන් වළකින්න.

  (යොදන පළිබෝධනාශකය ශාකයට අවශෝෂණය කර ගැනීමට පැය 3-4 ක් ගතවේ.)
- වගාවට යොදා ඉතිරි වූ දියර නැවත භාවිතා නොකරන්න.
- කුඩා ළමුන් හා සුරතල් සතුන්ගෙන් ඈත්ව තබන්න.
- වරින් වර බෝගයට යොදන්න.

කාර්වික පුතිඵල ළඟා ගැනීමට
කාබනික පළිබෝධනාශක වර්ග කිහිපයක්
මාරුවෙන් මාරුවට බෝගයට යෙදීම

## කාබනික පළිබෝධනාශක භාවිතයේ ඇති වාසි

- පරිසරයට කිසිදු අහිතකර බලපෑමක් නැත.
- යොදන පුද්ගලයාට ඉතාමත් ආරක්ෂාකාරිය.
- කෘමීන්ගේ විවිධ ජෛව ක්‍රියාවලියන්ට බාධා ඇති කිරීම තුළින් කෘමීන් මර්දනය වේ.
- කෘමීන් පලවා හරියි.
- පළිබෝධනාශක වලට ඔරොත්තු දෙන විවිධ මාදිලි ඇතිවීම වළක්වයි.
- රසායනික පළිබෝධනාශක වලට වඩා ඉක්මනින් වියෝජනය වේ. මේ නිසා අස්වැන්නෙහි අහිතකර කොටස් ඉතිරි නොවේ.
- කාබනික පළිබෝධනාශකවල කල්පවතින විෂ සහිත රසායනික ද්‍රව්‍ය අඩංගු නොවන නිසා පෙර අස්වනු කාලයක් අවශ්‍ය නොවේ. (කාබනික පළිබෝධනාශක යෙදූ විගස ද අස්වනු නෙලිය හැක.)

රසායනික පළිබෝධනාශක භාවිතය
හැකිතාක් අවම කරමින්
පරිසර හිතකාමී කාබනික පළිබෝධනාශක
භාවිතයට හුරු වෙමු.


සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - බෝඹුවල
034 - 2281846
තාක්ෂණ දායකත්වය- එස්.මල්මාලගේ


" සරු දිවියට කෘෂි සවියක් "

# පරිසර හිතකාමී පළිබෝධනාශක භාවිතා කරමු




කෘෂිකර්ම හා සත්ව පාලන ප්‍රදර්ශනය - 2018
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
බස්නාහිර පළාත

# ගෙවතු වගාව සඳහා භාවිතා කල හැකි කාබනික පළිබෝධනාශක

| ශාක සාර වර්ගය | සකස් කර ගන්නා ආකාරය | ඉලක්ක ගත කෘමීන් |
|---|---|---|
| 1. කොහොඹ බීජ සාරය | පොත්ත ඉවත් කරන ලද කොහොඹ ඇට ග්‍රෑ.50 ක් හොඳින් කොටා ජලය ලීටර් 01 ක් මිශ්‍ර කර මැටි බඳුනක දමා රෙදි කඩකින් වසා අඳුරු ස්ථානයක පැය 12 ක් පමණ තබන්න. මිශ්‍රණය මිරිකා පෙරාගත් ද්‍රාවනයට සබන් හෝ ටීපෝල් ස්වල්පයක් මිශ්‍රකර සවස් වරුවේ බෝගයට ඉසින්න. | කොල, ගෙඩි සහ කඳ විදින පණුවන්, පැල සහ කොල කන කීඩෑවන්, පත්‍ර කනින්නන් ,ඉල්මැස්සන්, මයිටාවන් හා සුදුමැස්සන් පාලනය වේ. |
| 2. කොහොඹ පත්‍ර සාරය | කොහොඹ කොල කි.ග්‍රෑ . 1 ක් හොඳින් කොටා එය වතුර ලීටර් 3 ට මිශ්‍ර කර මැටි භාජනයක දින 3 ක් තබා රෙදි කඩකින් පෙරා බෝගයට ඉසින්න. | කුඩිත්තන්, කීඩෑවන්, කොළ කන පණුවන්, කොරපොතු කෘමීන්. ගොළුබෙල්ලන්, පැලමැක්කන්, ගුල්ලන් හා සුදු මැස්සන් පාලනය වේ |
| 3. තෝර මුල් නිස්සාරකය | තෝර මුල් සිහින්ව කපා සබන් ස්වල්පයක් සමග මිශ්‍ර කර කොටා ජලයේ දියකර රෙදි කඩකින් පෙරා ඉසින්න. (බර අනුව සබන් 1 : මුල් 4 : ජලය ලීටර්. 1/2) | කොල කන දළඹුවන්, ගෙඩි විදින පණුවන්, ඉල්මැස්සන්, කුඩිත්තන් පාලනය කර ගත හැක. |
| 4. සුදුළූණු සාරය | සුදුළූණු ග්‍රෑ.100 ක් අඹරා එය ජලය ලීටර් 01 ක් සමග කලවම් කරන්න. භූමිතෙල් තේ හැඳි එකක් සහ සබන් ග්‍රෑ.10ක් එයට එක් කර එම මිශ්‍රණ පැය 24 ක් තබා පෙර ගන්න. 4 ගුණයක් තනුක කර ඉසින්න. | සියළුම වගාවල කුඩිත්තන්, කොල කන දලඹුවන් , එපිලැක්නා වැනි කුරුමිණියන් පාලනය වේ. |
| 5. අනෝදා ඇට නිස්සාරකය | අනෝදා ඇට පතක් කොටා ජලය ලීටරයක දියකර පෙරා ඉසින්න. | යුෂ උරා බොන මකුණන් පැල සහ පත්‍ර කීඩෑවන් පාලනය වේ. |
| 6. අනෝදා කොළ සාරය | අනෝදා කොල ග්‍රෑ. 500 ට වතුර ලීටර් 02 ක් එක්කර ලිප තබා රත්කරන්න. ලීටර් 1/2 දක්වා හිඳෙන්න හරින්න. පෙරා ගත් එම ද්‍රාවනයට වතුර ලීටර් 10-12 පමණ එක් කර ඉසින්න. | කුඩිත්තන් , සුදුමැස්සන් පාලනය වේ . |
| 7. රතුළූණු බල්බ සාරය | මැටි භාජනයකට වතුර ලීටර් 01 ක් දමා හොඳින් උණු කරන්න. පොඩි කර ගත් රතුළූණු කි.ග්‍රෑ. 1 ක් දමා රෙදි කඩකින් කට ගැට ගසා පැය 24 ක් තබා පෙරා එයට වතුර ලීටර් 10 ක් මිශ්‍රකර ඉසින්න. | කුහුඹුවන්, කොරපොතු කෘමීන්, මයිටාවන් සහ පැල මැක්කන් පාලනය වේ. |
| 8. සේර සාරය | සේර කොල සහ මුල් ග්‍රෑ.250 ක් කොටා වතුර ලීටර් 01 ක මිශ්‍ර කර පැය 4-5 ක් තබා පෙරා බෝගයට ඉසින්න. | බැක්ටීරියා රෝග පාලනය කිරීමේ හැකියාවක් ඇත. |
| 9. තක්කාලි දඬු සාරය | තක්කාලි කඳන්, පත්‍ර හා ශාකයේ කොටස් සිහින්ව කපා පොඩි කර එකට එකක් ජලය එකතු කර මදගින්නේ තම්බා පෙරා වගාවට ඉසින්න. | කෘෂි විකර්ශක ගුණය නිසා කෘමීන් පලවා හැරිය හැක. |
| 10. කහ අල | අඹරා ගත් කහ අල කොටස් 2 ක් , ගව මුත්‍රා කොටස් 6 ක් , ජලය ලීටර් 1 ක් සමග මිශ්‍ර කර ඉසින්න. | කොල කන දළඹුවන්, කරල් විදින පණුවන්, මයිටාවන් පාලනය වේ. |
| 11. අරලිය මල් | අරලිය මල් කිණිති 2-3 ක් ජල බඳුනකට දමා දින කිහිපයක් තබා එම මිශ්‍රණයට සීනි ස්වල්පයක් එක්කර පෙරා සබන් ස්වල්පයක් මිශ්‍ර කර වගාවට ඉසින්න. | ගෙවත්තේ වගාවන්ට හානි කරන කෘමීන් පාලනය කරගත හැකිය. |
| 12. ගව මුත්‍රා | ගව මුත්‍රා සති දෙකක් පමණ හිරු එළිය වැටෙන ස්ථානයක තබා සකාරවා ගන්න. එම ද්‍රාවණය හය ගුනයක් තනුක කර බෝගයට ඉසින්න. | කෘමි හා දිලීර රෝග පාලනය කර ගත හැක. |
| 13. පැපොල් කිරි සාරය | කිරි සාරයෙන් අධික අමු පැපොල් ගෙඩියක් ගෙන සිහින්ව ලියා වතුර ලීටර් 8 ක් සමග මිශ්‍ර කර පැය 12ක් තබා පෙරා වගාවට ඉසින්න. | මයිටාවන්, කුඩිත්තන්, පැලමැක්කන් පාලනය කර ගත හැක. |
| 14. මඩු මල් | මඩු මල් කිනිති ගෙන පුදින ගොයමේ තැනින් තැන එල්ලා තබන්න. | ගොයම් මකුණන් පාලනය සඳහා |
| 15. වල් සූරියකාන්ත සාරය | පත්‍ර කි. ග්‍රෑ. 1 -2 ක් කොටා එම ශාක සාරය ජලය ලීටර් 1 ක දියකර ඉසින්න. | දියමන්ති සළකුණ ඇති සළඹයා, රතු කපු මකුණා, පණුවන් මර්දනය සඳහා |
| 16. කුරුඳු කොළ සාරය | කුරුඳු කොළ ග්‍රෑ. 250 ක් හොඳින් කොටා ජලය ලීටර් 1 කට එක්කර මිරිකා පෙරා එම සාරය ඉසින්න. | පේර වගාවේ රෝග පාලනය කර ගත හැක. |
| 17. දුම්කොල නැටි සාරය | දුම්කොල නැටි අහුරක් ගෙන ජලය ලීටර් 1 හා කලවම් කර හොඳින් නටවා නිවෙන්නට හැර පෙරා ඉසින්න. | පණුවන් මර්දනය වේ . |
| 18. කොච්චි සාරය | කොච්චි ග්‍රෑ. 100 ක් හොඳින් අඹරා ජලය ලීටර් 1 ක් සමග කළවම් කර පැය 24 ක් තබා හොඳින් පෙරා එම ද්‍රාවණය 5 ගුණයකින් තනුක කර බෝගයට ඉසින්න. | කුහුඹින්, කුඩිත්තන්, පණුවන්, ගුල්ලන් මර්දනය සඳහා |

